3 වන පිටෙන්

යටපත් කෙරුණු පනත් කෙටුම්පතය. නැවත බොරු පොරොන්දු නොදී ජනතාවට තොරතුරු දැනගැනීමට නිත්‍යානුකූල අයිතියක් ලබාදීමට තමන් විරුද්ධ බව ආණ්ඩු පක්ෂය ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත්කළේ එම අවස්ථාවේදීය. හාස්‍ය ජනක කරුණ නම් ඒ බව ප්‍රකාශ කළේද දිනේෂ් ගුණවර්ධන ජනතා නියෝජිතයා විසින්ම වීමය.

මේ වනවිට ලෝකයේ රටවල් 90කට වැඩි සංඛ්‍යාවක් සිය රට වැසියන්ට තොරතුරු දැනගැනීමට ඇති අයිතිය තහවුරු කරමින් නීති හඳුන්වා දී තිබේ. අසල්වැසි මාල දිවයින වැනි රටවල් පවා එම නීති ස්ථාපිත කිරීමට කටයුතු කරගෙන යයි. සාක් රටවල් අතරින් ලංකාව හැර සෙසු රටවල් වන ඉන්දියාව, පකිස්ථානය, බංගලිදේශය, මෙන්ම නේපාලය ද මේ වනවිටත් තොරතුරු දැනගැනීමේ නීති හඳුන්වා දී අවසානය. එහෙත් ලංකාවේ ආණ්ඩු පක්ෂය ඊට විරුද්ධය. තොරතුරු දැනගැනීමේ අයිතිය ජනතාවට ලබාදෙනවාට කැමති මන්ත්‍රීවරුන්ද ආණ්ඩු පක්ෂයේ සිටිනවා විය හැකි වුවත් ඔවුන්ට සිය හෘද සාක්ෂියට එකගව ඒ වෙනුවෙන් පෙනීසිටින්නට නොහැකිවා විය හැකිය. ඒ ජනාධිපති මහින්ද රාජපක්ෂ මේ සම්බන්ධයෙන් දරන ස්ථාවරය නිසාය. ජනාධිපතිවරයා මාසිකව පවත්වන මාධ්‍ය ආයතන ප්‍රධානීන් හමුව අරලියගහ මන්දිරයේදී පවත්වනු ලැබුවේ ජයසූරිය මන්ත්‍රීවරයාගේ යෝජනාව පාර්ලිමේන්තුවේදී ආණ්ඩු පක්ෂය විසින් පරාජයට පත්කිරීමෙන් දින කීපයකට පසුවය. මෙහිදී ඒ සම්බන්ධයෙන් සහ ආණ්ඩු පක්ෂය විසින් ගෙන එන බවට පැවසූ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සම්බන්ධයෙන් මාධ්‍ය ආයතන ප්‍රධානියෙකු ජනාධිපතිවරයාගෙන් විමසා සිටි විට ඔහු දුන් පිළිතුර සති අන්ත පුවත්පතක දේශපාලන තොරතුරු විග්‍රහයේ සටහන්ව තිබුණේ මෙලෙසිනි.

'ආ... ඒක පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක්නේ... මට කියන්න මොන තොරතුරුද ඔබතුමන්ලා නොදන්නේ. මෙහෙ කැබිනට් පේපර් එකක් දරන-කොට ඒකෙ පිටපත් ඔබතුමාල ලගටත් එනවා මම හොදටම දන්නවා... මොන තොරතුරක්වත් තමුන්නාන්සේලාගෙන් හංගන්න බෑනේ. තවත් මොනවද ඉතිං ඔය ගැන කතාකරන්නේ.' යැයි කියමින් ජනාධිපතිවරයා රැස්වීම අවසන් කළ බව පුවත්පතේ වැඩිදුරටත් සඳහන් විය. ඒ අනුව ජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය ලබාදීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ ස්ථාවරය ඉතා පැහැදිලිය. එවැනි පසුබිමක තමන් කවර මතයක් දැරුවද ආණ්ඩු පක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙකුට ජනාධිපතිවරයාගේ අභිමතයට පටහැනිව කටයුතු කරන්නට ඉඩක් නැත. පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීම පැවැත්වූ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයේ එක්තරා ඇමැතිවරයෙකු තමන් මේ යෝජනාවට පක්ෂව ඡන්දය දෙන බව ප්‍රකාශ කර සුලුවේලාවකට පසුව යළි නැගී සිට තමන්ට වරදක් සිදුවූ බවත් තමන්ද මේ පනතට විරුද්ධ බවත් ප්‍රකාශ කිරීමෙන්ද පැහැදිලි වන්නේ එයම නොවේද ?

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් පවතින රටක එය නියමාකාරයෙන් ක්‍රියාත්මකවීමට නම් ජනතාවට තොරතුරු දැනගැනීමට ඉඩ සහ අයිතිය තිබිය යුතුය. තමන් සතු තොරතුරු ප්‍රමාණය විශාල වන තරමට තමන් ගන්නා තීරණයේ නිරවද්‍යතාව ඉහළ මට්ටමකට ගෙන එන්නට ජනතාවට හැකියාව ලැබෙන අතර ලැබෙන තොරතුරු ප්‍රමාණය අඩුනම් හෝ තොරතුරු ලබාගැනීමට ඉඩක් නොමැතිනම් නිවැරදි තීරණයක් ගැනීමට ජනතාවට ඇති හැකියාව සීමා සහිතවේ. එවිට නිසි පුද්ගලයන්ට වඩා තක්කඩියන්ට ජනතා නියෝජිතයන් ලෙස පාර්ලිමේන්තුවට යාමට ඇති හැකියාව වැඩිවේ. ආණ්ඩු පක්ෂයේ විරෝධතාවය අප තේරුම්ගත යුත්තේ එනයිනි.

ලෝකයේ වේගයෙන්ම කෝටිපතියන් බිහිකරන මුල්ම රටවල් 10 අතරට ශ්‍රී ලංකාව ඇතුළත්ව ඇති බවට ලෝක සම්පත් කළමණාකරන ආයතනය පසුගියදා නිකුත් කළ ලොව ධනවත්කම පිළිබඳ 15 වන වාර්ෂික වාර්තාවේ සඳහන්ව තිබේ. ඒ අතරින් වැඩි පිරිස තරුණ කෝටිපතියන් බවද පවසන එම වාර්තාව අනුව එකී ධනවත් බව තීරණය කිරීමේ නිර්ණායකය වන්නේ නිශ්චල දේපොළ හැර ඇමරිකානු ඩොලර් ලක්ෂ 10 කට වැඩි වත්කමක හිමිකාරිත්වයයි. මෙලෙස කෝටිපතියන් පැටව් ගසන රටවල් අතරට ලංකාවත් එක්ව ඇත්තේ රටේ සිදුවූ කවරාකාර ආර්ථික වර්ධනයක් නිසාද ?

අප දන්නා තරමට මෑත කාලීනව එවැනි වර්ධනයක් සිදුවූ ක්ෂේත්‍රයක් නොමැති තරම්ය. රටේ සංවර්ධනයක් සිදුවෙමින් පවතින්නේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මගිනි. මාර්ග සංවර්ධනය විශාල වශයෙන් සිදුවෙමින් පවතින අතර ගුවන් පාලම් ඇතුළු විශාල පාලම් තැනින් තැන කඩිනමින් ඉදිවෙමින් පවතියි. හම්බන්තොට වරාය ඇතුළුව තවත් බොහෝ යටිතල පහසුකම් සීඝ්‍රගාමී ලෙස වර්ධනය වෙමින් පවතී. එහෙත් මේවා සිදුවන්නේ

***<u>ලෝකයේ වේගයෙන්ම කෝටිපතියන් බිහිකරන මුල්ම රටවල් 10 අතරට ශ්‍රී ලංකාව ඇතුළත්ව ඇති බවට ලෝක සම්පත් කළමණාකරන ආයතනය පසුගියදා නිකුත් කළ ලොව ධනවත්කම පිළිබඳ 15 වන වාර්ෂික වාර්තාවේ සඳහන්ව තිබේ</u>.***

කෙසේද? ඒ සඳහා ආධාර ලැබෙන්නේ කෙසේද? ඒ කවර කොන්දේසි යටතේද? ලැබෙන ආධාර නියමාකාරයෙන් අදාළ කටයුතු වෙනුවෙන්ම යෙදවෙන්නේද? ආදී කිසිවක් රටේ ජනතාව දන්නේ නැත. ඒ කටයුතු බාරව සිටින ආණ්ඩුව ඒ ගැන කිසිවක්ම කියන්නේද නැත. ඒ නිසාම තමන්ට අවශ්‍ය ඕනෑම ආකාරයකට මේවා පවත්වාගෙන යන්නට ආණ්ඩු පක්ෂයට සහ එහි හිතවතුන්ට අවස්ථාව ලැබේ. ජනතාවට මේවා ගැන විමසා සිටීමේ අයිතියක්ද නැත. තොරතුරු දැනගැනීමේ නෛතික අයිතියක් ජනතාව සතුනම් මෙවැනි තත්ත්වයක් පවත්වාගෙන යන්නට ආණ්ඩු පක්ෂයට ඇති හැකියාව අහෝසිවීම හෝ සීමා වීම සිදුවන අතර එමගින් සිදුවිය හැකි දූෂණ සහ නාස්තිය අවම කරගැනීමට හැකියාවද ලැබේ. මේවායින් කෝටිපතියන් බිහිවන ක්‍රමවේදයක් තිබේද නොතිබේද යන්න සාක්ෂි සහිතව හෙළිදරව් කරගන්නට නම් තොරතුරු දැනගැනීමේ අයිතියක් ජනතාවට තිබිය යුතු අතර එය ප්‍රායෝගිකව ක්‍රියාවේද යෙදිවිය යුතුය.

මෙවැනි මහා පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් පමණක් නොව ලංකාවේ බැංකුවකින් මූල්‍ය පහසුකමක් ලබාගන්නා ගණුදෙනුකරුවකුට ඒ සම්බන්ධයෙන් වන විමසීමකට පිළිතුරක් ලබාගැනීමට පවා අද හැකියාවක් නොමැත. මාධ්‍යවේදී ණය යෝජනා ක්‍රමය යටතේ මහජන බැංකුවෙන් ණය මුදලක් ලබාගත් මාධ්‍යවේදියෙකු විසින් එම ගණුදෙනුවට අදාළ පොලී අනුපාතයන් ආදී විස්තර තමන්ට ලබාදෙන ලෙස ඉල්ලා එම බැංකු ශාඛාවේ කළමණාකරුගේ සිට මුදල් ඇමැතිවරයා දක්වා සියලුම වගකිවයුතු නිලධාරීන් වෙත වරින් වර ලිපි ගණනාවක් යවන ලද නමුත් වසරක් ගතවීත් ඒ සම්බන්ධයෙන් කිසිම තොරතුරක් මාධ්‍යවේදියා වෙත ලබානොදීමේ සිද්ධියක් ද පසුගියදා වාර්තා විය. ආයතන සංග්‍රහය මගින් රජයේ සේවකයන්ට තොරතුරු ලබාදීමට ඇති අයිතිය අහෝසිකර ඇති අතර එමගින් මහජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතියද අහෝසි කර තිබේ. අමාත්‍යාංශ මට්ටමින් විවිධ චක්‍රලේඛ යවමින් ආයතන ප්‍රධානීන්ටද තොරතුරු ලබාදීම තහනම් කර ඇති අමාත්‍යාංශ ගණනාවකි.

මේ සියල්ලෙන් පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදයේ අංග විකල බවයි. එය කෙතෙක් අංග විකල බවට පත්ව ඇත්තේද යත් ඒකාධිපති පාලනයකින් වෙන් කර හඳුනාගැනීමට දුෂ්කර වෙමින් පවතියි. ලංකාවේ මෙවැනි තත්ත්වයක් වර්ධනය වෙමින් පවතින්නේ අරාබි ලෝකයේ රටවල් ගණනාවක දීර්ඝ කාලයක් පැවැති ඒකාධිපති පාලනයන් බිඳ වැටෙමින් පවතින තත්ත්වයක් යටතේය. ලෝකය ඉදිරියට ගමන් කරද්දී ලංකාව ගමන් කරමින් සිටින්නේ කොයි ඉසව්වකටද යන්න ඉන් පෙනෙයි.

.

ශ්‍රීලාල් සෙනෙවිරත්න
Srilal333@gmail.com

EASE YOUR TAX BURDEN, ENHANCE YOUR WEALTH

FOR ALL YOUR

TAX

RETURNS

BAS & IAS

Bookkeeping

Tax Planning

Business Consulting

Amal Ramyanath
CPA, ACA, MBA & B.Sc

Registered Tax Agent

GUSS DESIGN 9769 0099

SANDAL
TAX ADVISORS

31 MADELINE STREET
GLEN WAVERLEY VIC 3150

T | 03 8802 8818
F | 03 8802 8818
M | 0412 775 889
sandalmanagement@optusnet.com.au

PROFESSIONAL, FRIENDLY & PERSONALIZED SERVICE